බේරුවල ප්‍රාදේශීය සභාව
කළුතර දිස්ත්‍රික්කය
--------------------------------

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බේරුවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ජේසිබී යන්ත්‍රයේ අමතර කොටස් හා ටයර් සඳහා 2010 හා 2011වර්ෂ වලදී වියදම් කර ඇති රු.242,600 ක මුදල එම වර්ෂයන්හි වියදමට ඇතුළත් නොකර, අත්තිකාරමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 2017 වර්ෂයේ එකතු කල අගය මත බදු (vat) අය නොකරන කර්මාන්ත 16 ක් එකතු කළ අගය මත බදු එකතුකර බිල් කිරීම නිසා ප්‍රාග්ධන වියදම රු1,629,012 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) කොම්පෝස්ට් බඳුන් 25 ක් මිලදී ගැනීම සඳහා වැය කර තිබූ රු.31,875 ක මුදලක් මෝටර් රථ හා කරත්ත ගිණුමෙහි දක්වා තිබුණි.

(ඈ) සභාවේ මාර්ගතලනය වෙනුවෙන් ලැබිය යුතු රු.118,852 ක මුදල ආදායම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල නොදක්වා කර්මාන්ත ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

1.3.2 **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

2007 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළව දුම්රිය දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු.90,101 ක හිඟ වරිපනම් බදු ශේෂයන් අයකර ගෙන නොතිබුණි.

1.3.3 **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>**

අයිතිය තහවුරු කරන හිමිකම් ඔප්පු හෝ පැවරුම් නියෝග හා සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.170,285,768 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1:3:4 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | --- | සභාව සතු සියළු ඉඩම්, ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) 2016 දෙසැම්බර් 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1999 දරන ගැසට් පත්‍රය | 128,460 | 2017 වර්ෂයට අදාලව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ නිවේදනයට අනුව ප්‍රාදේශීය සභා සීමාව තුළ සවිකළ ප්‍රචාරක දැන්වීම් පුවරු 49 කින් අය කළ යුතු රු.93,780 ක අදායමක් අය කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| මුදල් රෙගුලාසි 756, 757 හා 1647(අ) | --- | වාහනයේ උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් හා නිලධාරියෙකුගෙන් තවත් නිලධාරියෙකුට වාහනය භාර දෙනු ලබන අවස්ථාවේදී වාහන සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඈ) 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | --- | වරිපනම් වලට යටත් වන , දේපළ වසර 05 කට වරක් තක්සේරු කර නොතිබුණි. |
| (ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදය | | ආයතනය සතු සියළුම වාහන වල ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි. |

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2:1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.55,699,159 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,319,213 ක් විය.

## 2:2 ආදායම් පරිපාලනය

### 2:2:1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 15,266,375 | 17,403,708 | 18,873,253 | 12,902,511 | 15,964,500 | 16,188,202 | 19,172,154 | 13,529,956 |
| (ii) කුලී | 25,834,430 | 15,282,815 | 15,682,994 | 3,139,393 | 23,166,605 | 20,428,168 | 18,116,553 | 3,549,573 |
| (iii) බලපත්‍ර ගාස්තු | 4,400,630 | 4,263,287 | 4,273,287 | 10,000 | 3,240,360 | 3,372,933 | 3,352,932 | 20,000 |
| (iv)වෙනත් ආදායම් | 53,992,495 | 44,000,000 | 46,506,665 | 79,622,624 | 68,897,000 | 56,950,000 | 36,059,505 | 82,339,164 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.99,438,693 ක් වූ අතර වර්ෂයට අදාල බිල් කිරීම් රු.80,949,810 ක් විය. වර්ෂය තුළ ලැබීම් කපා හැරීම් හා ගැලපුම් රු.84,713,975 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට සමස්ථ ආදායම් හිඟය රු.95,674,528 ක් විය.

### 2.2.3 වරිපනම් හා බදු

වරිපනම්

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.12,626,630 ක වරිපනම් හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.6,222,705 ක් හෙවත් සියයට 49 ක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කිරීම් රු.13,751,331 ක් වූ අතර වර්ෂය තුළදී ලැබීම් රු.8,858,172 ක් හෙවත් සියයට 64 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ වරිපනම් බදු හිඟයෙන් වර්ෂය අවසානයට තවදුරටත් අයවිය යුතු හිඟය රු.6,403,925 ක් වූ අතර ඉන් වර්ෂ 3 දක්වා හිඟය රු.2,133,581 ක්, වර්ෂ 3 ත් 5 ත් අතර හිඟය රු.3,964,559 ක් හා වර්ෂ 10 ට වඩා වැඩි හිඟය රු.1,543,760 ක් විය. දීර්ඝ කාලීනව පවතින වරිපනම් බදු සම්බන්ධයෙන් පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

### 2.2.4 කුලී

(අ) ඉදිරිපත් කර තිබූ හිඟ කඩ කුලී කාල විශ්ලේෂණයට අනුව 2017 දෙසැම්බර් 31 දිනට වූ රු.3,081,150 ක හිඟ කඩකුලී ශේෂය තුල වර්ෂ 01 ට වඩා අඩු ඒකක 98 කින් රු.1,002,950 ක්, වර්ෂ 01 ත් 03 ත් අතර ඒකක 23 කින් රු.695,700 ක් හා වර්ෂ 01 ත් 05 ත් අතර ඒකක 17 කින් අයවිය යුතු රු.1,382,500 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය වූ රු.2,910,700 න් රු.666,000 ක් හෙවත් සියයට 23 ක් පමණක් අය කර ගෙන තිබුණි.

2.2.5 <u>බලපත්‍ර ගාස්තු</u>

<u>ව්‍යාපාර බදු</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය වූ රු.896,325 න් රු.552,600 ක් හෙවත් සියයට 62 ක් පමණක් අය කර ගෙන තිබුණි.

2.2.6 <u>වෙනත් ආදායම්</u>

<u>සංචාරක සංවර්ධන බදු මුදල්</u>

(i) 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද හෝටල් 08 කින් මුළු ආදායමින් සියයට එක දක්වා වූ ගාස්තුවක් අයකර නොතිබුණි.

(ii) ලලුනා හෝටලයේ 2015 වර්ෂය සඳහා අඩුවෙන් අය කළ රු.91,635 ක් හා 2016 වර්ෂය සඳහා අඩුවෙන් අය කළ රු.113,190 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(iii) පිළිගත් වෘත්තිය ගණකාධිකාරි ආයතනයක් විසින් සහතික කරන ලද ගිණුම් ඉදිරිපත් නොකල අවස්ථා පැවති අතර ආපන ශාලා හා බීමහල් ආදායම පමණක් පදනම් කර ගෙන බදු අය කළ අවස්ථා පැවතුනි.

2.2.7 **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.27,200,505 ක් හා මුද්දර ගාස්තු රු. 52,422,119 ක් විය. කෙසේ නමුත්, උසාවි දඩ ශේෂය තුල රු.15,000,000 ක පමණ අධි ඇස්තමේන්තුවක් පැවති බව නිරීක්ෂණය විය.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3:1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 10 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ප්‍රතිපාදන නොසැලසීම</u>

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) **<u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

කසළ කළමනාකරණය වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.37,484,805 ක වියදමක් දරා තිබූ අතර කසළ කළමනාකරණය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණි.කසළ බැහැර කරන ප්‍රදේශ සඳහා පරිසර බලපත්‍රයක්ද ලබාගෙන නොතිබූ අතර කසළ බැහැර කිරීම වෙනුවෙන් ප්‍රදේශයේ පවතින කර්මාන්තශාලා 02 කින් ගාස්තු අයකර නොතිබුණි.

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>
තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍යය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 ජූනි 11 දින වන විටත් සකස් කර නොතිබුණි.

3:2 **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) කඩකාමර ඉදිකිරීමේදී වෙළඳසැල පිළිබඳ අනවබෝධයකින් සැලසුම් කිරීම හේතුවෙන් දර්ගානගරයේ පොදුවෙළඳසැල කඩ කාමර 09 ක් බදු දීමට නොහැකි වී තිබුණි.

(ආ) ඉඩම් කොටස් කර විකිණීමේදී පොදු පහසුකම් සඳහා නුසුදුසු ඉතා බෑවුම් සහිත ඉඩම් ලබාගෙන තිබුණි.

(ඇ) ඉඩම් වෙන්දේසි කිරීමේදී පොදු පහසුකම් සඳහා ලැබී තිබූ ඉඩම් කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා යොදා නොගත් අවස්ථා පැවතුනි.

(ඈ) රාජ්‍ය නොවන සංවිධානයක මුදල් ආධාරයෙන් 2013 වර්ෂයේදි අළුත්ගම සති පොළ පවතින ස්ථානයේ කඩකාමර කඩා නවීකරණය කර තිබුණි. නවීකරණය කළ කඩ කාමර 38 කින් 2018 පෙබරවාරි 22 දින වන විටත් විවෘත කර තිබුණේ කඩ කාමර 05 ක් පමණි. මෙම සියළුම කඩ කාමර වලින් කුලී අය නොවන අතර කඩ කාමර වඩා ඵළදායි වන ආකාරයට මාර්ගයට විවෘත වන සේ සැලසුම් කර නොතිබුණි.

(ඉ) දර්ගානගරයේ පොදු වෙළඳපොළේ ඉහල මහලේ කොන්ක්‍රිට් තට්ටුව (slab) ශක්තිමත්ව නොතිබුණි.

(ඊ) වතුර බවුසර්වල වගකීම කාර්මික නිලධාරිනියට භාර දී ඇතත් කාර්මික නිලධාරිනියගේ අනුදැනුමකින් තොරව වතුර බවුසර් ක්‍රියාවේ යොදවා තිබුණි.

(උ) බේරුවල ප්‍රාදේශිය සභාව සතු ගාළු පාර අංක 290 දරන ගොඩනැගිල්ලේ බදු කාලය 2016 දෙසැම්බර් 01 දිනෙන් අවසන්වීම නිසා නැවත බදුදිම සඳහා පුවත්පත් නිවේදනයක් මගින් ටෙන්ඩර් කැඳවා තිබුණි. ඒ අනුව ආයුර්වේද සංස්ථාව මාසික කුලිය රු.60,000 බැගින් ගෙවා බදු ගැනීමට එකඟතාවය පළකර තිබුණ ද පෙර බදුකරු 2018 පෙබරවාරි වන විටත් ගොඩනැගිල්ල භාරදීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2018 පෙබරවාරි වනතුරුත් නීතිමය ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

3:3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) <u>සේවක පුරප්පාඩු හා අතිරික්ත</u>

(i) ලේකම් තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා කළමනාකරණ සහකාර 1 ශ්‍රේණියේ නිලධාරිනියක් පත්කර තිබුණි.

(ii) ද්විතීයික මට්ටමේ නිලධාරින් 06 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර 03 දෙනෙකු අතිරික්තව පැවතිණි.

(iii) ප්‍රාථමික මට්ටමේ නිලධාරින් 04 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර 36 දෙනෙකු අතිරික්තව පැවතිණි.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක25/2014 යටතේ ස්ථිර කළ සේවකයින් 43 දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර නොතිබුණි.

(v) අනියම්, තාවකාලික, කොන්ත්‍රාත් සේවකයින් 27 දෙනෙකුගේ අතිරික්තයක් පැවතිණි.

(ආ) <u>බැහැර යාමට අනුමැතිය ලබා නොගැනීම</u>

ප්‍රාදේශිය සභාවේ උප කාර්යාල වල සේවකයින් බැහැරයාමේ ලේඛනයේ සඳහන් නොකර හා පූර්ව අනුමැතියකින් තොරව බැහැර ගිය අවස්ථා නිරීක්ෂණය විය.

3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) 2017 වර්ෂය වෙනුවෙන් බේරුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් තෝරා ගත් පාසැල් හා රාජ්‍ය ආයතන කිහිපයක බඳුන් මත පැළ සිටුවීම පිළිබඳ දැනුවත් කර පැළ ලබාදීම සඳහා රු.499,995 ක මුදලක් වැය කර ඇතත් 2018 පෙබරවාරි 22 දින වන විටත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වි නොතිබුණි.

(ආ) ග්‍රාමීය මට්ටමේ රුක් රෝපණ වැඩ සටහන් දියුණු කිරීම හා දිරිමත් කිරීම සඳහා බේරුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රජාව වෙත පැළ ලබාදීම වෙනුවෙන් රු.500,000 ක් පාදාගොඩ ගොවිජන සේවා කාරක සභාව වෙත ගෙවා තිබුණ නමුත් 2018 පෙබරවාරි 22 දින වන විටත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඇ) විදුලි අංශයේ කටයුතු විධිමත් පරිදි අධීක්ෂණයකට ලක් වී නොතිබුණි.

(ඈ) කඩ කාමර 14 කින් සමන්විත හල්කඳවිල සාප්පු සංකිර්ණය 2015 දෙසැම්බර් 15 දින වන විට ඉදි කිරීම් අවසන් කර විවිධ ආයතන හා පුද්ගලයින්ට ලබාදී තිබූ නමුත් අංක 01,02,08,09,10 යන කඩ කාමර සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබුණි. මේ සඳහා කඩකුලී අයකිරීමක් ද සිදු කර නොතිබූ අතර අංක 09 කඩ කාමරය භාවිතා කර නොතිබුණි.

(ඉ) 2017 වර්ෂයේදී හඳුනාගත් පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ආයතන 03 ක් සඳහා පාරිසරික බලපත්‍ර නිකුත් කර නොතිබූ අතර පෙර වර්ෂයන්හි පාරිසරික බලපත්‍ර ලබාගෙන තිබූ ආයතන 32 ක් සඳහා පාරිසරික බලපත්‍ර අළුත් කර නොතිබුණි.

3.5 <u>වත්කම් කළමණාකරණය</u>

3.5.1 <u>වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම</u>

සභා ඉඩම්වල අයිතිය සභාව සතුවන බවට නාමපුවරු සවිකර නොතිබූ අවස්ථා පැවතුණි.

3.5.2 <u>පවරා නොගත් වත්කම්</u>

හල්කඳවිල කඩසාප්පු සංකීර්ණය ප්‍රාදේශීය සභාවට පවරාගෙන නොතිබුණි.

3.5.3 <u>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

(අ) සභාව සතු අළුත්ගම පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර 26 ක් වසර 15 ක පමණ සිට බදු දීමකින් තොරව පැවතුණි.

(ආ) අළුත්ගම උපකාර්යාලය සතු එක් ජල බවුසරයක් නිෂ්ක්‍රීයව පැවතිණි.

3.5.4 <u>තොග ඌනතා</u>

අළුත්ගම උපකාර්යාලයේ ඉන්වෙන්ට්‍රිය අනුව ලීටර් 1000 ජල ටැංකිවල 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය 2017 වර්ෂය තුල ලැබීම් හා 2017 දෙසැම්බර් 31 දිනට භෞතික ශේෂය සැසඳීමේදී ජල ටැංකි 11 ක ඌනතාවයක් පැවතුනි.

3.5.5 <u>වාහන උපයෝජනය</u>

(අ) වාහන 03 ක් වෙනුවෙන් ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අබලන් වාහන 03 ක් අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) අත් ට්‍රැක්ටරයක් පයාගල උපකාර්යාලයේ තිබියදී අතුරුදහන්ව තිබූ නමුත් අතුරුදහන් වූ කාල වකවානුවක් සොයාගත නොහැකි විය. 2010 ජුනි 15 සභා වාර්තාව අනුව 2010 අප්‍රේල් රක්ෂණ වාරික ගෙවා තිබුණි. මේ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.6 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

ඇස්තමේන්තු වටිනාකම රු.874,332 ක් වූ බේරුවල පාදාගොඩ සමගි මාවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අනුමත සමිතියක් නොවන කොන්ත්‍රාත් ආයතනයක් විසින් ඉටුකර තිබූ නමුත් මෙම ආයතනය තෝරා ගැනීමේදී, විවෘත මිල කැඳවීම් කර තරඟකාරී මිල යටතේ සභාවට වාසියක් ලැබෙන පරිදි කටයුතු කර නොතිබුණි.

4. **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

4:1 **<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත හා තථ්‍ය ආදායම් සියයට 07 සිට සියයට 41488 දක්වාත් වියදම් සියයට 07 සිට සියයට 260 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5. **<u>පද්ධති හා පාලන</u>**

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | ---------- | | ---------- |
| (අ) | ගිණුම්කරණය | | ගිණුම්වලින් අත්හැරීම්, අඩුවෙන් හා වැඩියෙන් සටහන්වීම් තිබීම |
| (ආ) | වත්කම් පාලනය | (i) | වත්කම්වල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබීම |
| | | (ii ) | වත්කම් නිසිලෙස හඳුනාගෙන නොතිබීම |
| | | (iii) | වත්කම් නිසි පරිදි උපයෝජනය නොකිරීම |
| (ඇ) | තොග | (i) | ලේඛනගත නොකිරීම |
| | | (ii) | අවිධිමත් තොග පාලනය |
| (ඈ) | ආදායම් පාලනය | (i) | හිඟ බදු අයකරගැනීම් ප්‍රමාණවත් පරිදි සිදු නොවීම |
| | | (ii) | බදු තක්සේරු නියමිත කලට සිදු නොකිරීම |
| (ඉ) | සේවක කළමනාකරණය | (i) | කාර්ය මණ්ඩලය විධිමත් කර නොගැනීම |
| | | (ii) | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |
| (ඊ) | අයවැය පාලනය | (i) | අයවැය හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් පැවතීම |
| | | (ii) | ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම |